**ජාතික සමුපකාර සංවර්ධන ආයතනය - 2013**

ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 2001 අංක 1 දරන ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල

උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08

පසුගිය වර්ෂයට අදාළ වියදම් එකතුව රු.65,441 ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාර අතීතානුයෝගී නැවත ප්‍රකාශ කිරීම ලෙස ගිණුම්ගත කරනු වෙනුවට පෙර වර්ෂ ගැළපීම් ලෙස සමාලෝචිත වර්ෂයේ සමුච්චිත ලාභයට ගළපා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16

දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම අයත්වන පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළයුතු වුවත් වටිනාකම සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද

එහෙත් තවම භාවිතා කරන පිරිවැය රු.මිලියන 45.19 ක් වූ දේපල, පිරියත හා උපකරණවලින් පිරිවැය රු. මිලියන 25.67 ක් වූ වත්කම් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) V පරිච්ඡේදයේ 2.1 වගන්තිය, 2.4 වගන්තිය සහ 2007 මැයි 11 දිනැති අංක 2007/09 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා කාර්යාලයේ පූර්ණ කාලීනව සේවයේ නියුතු නිලධාරියෙකු පත්කිරීමේ බලධාරියාගෙන් අවසරය ලබා ගැනීමකින් තොරව ආයතනයේ ශ්‍රවණාගාරය ඉදිකිරීම් උපදේශක සේවය සඳහා පත්කර තිබුණි. මෙම නිලධාරියා විශ්‍රාම ගැනීමෙන් පසුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා නොගෙන නැවත රජයේ සේවයට පත්කර තිබුණි. |
| (ii) V පරිච්ඡේදයේ 2.5.3 වගන්තිය | රාජ්‍ය සංස්ථාවක සේවය සඳහා තාවකාලිකව මුදා හරිනු ලබන රජයේ නිලධාරියකුගේ නව ඒකාබද්ධ වැටුපෙන් සියයට 25 ක් විශ්‍රාම වැටුප් දායක මුදලට ප්‍රේෂණය කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 71 | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ පූර්ව අනුමැතියකින් තොරව කළමනාකරණ මණ්ඩලයේ තීරණය මත පමණක් උපදේශකවරයකු පත්කර, උපදේශක ගෙවීම් ලෙස මාසයකට රු.40,000 බැගින් 2010 ජූලි 31 සිට 2014 ජූලි 31 දක්වා එකතුව රු.1,240,000 ක් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 136 | ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ හෝ බලයලත් නිලධාරියෙකුගේ නිර්දේශයක් නොමැතිව කිරි ගම්මාන ව්‍යාපෘතිය වෙනුවෙන් එකතුව රු.130,300 ක වියදම් දරා තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 169 | ආදායම් උපලබ්ධි වීමට පෙර සේවා සැපයීම සිදු නොකළ යුතු වුවත්, ගාස්තු අය කිරීමකින් තොරව දේශනශාලා, ආහාර, නවාතැන් හා මුද්‍රණ ගාස්තු සේවා පහසුකම් ලබා දී තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ හිඟහිටි ආදායම රු.1,342,674 ක් විය. |
| (iv) මුදල් රෙගුලාසි 395 (ඌ) | එකතුවන මුදල් බැංකුවේ තැන්පත් කිරීම, චෙක්පත් ලිවීම හෝ මුදල් පොත පවත්වා ගැනීම යන කාර්යයන්වලට කිසිදු සම්බන්ධතාවයක් නොමැති නිලධාරියෙකු විසින් බැංකු සැසඳුම් විස්තර පිළියෙල කළ යුතු වුවද, ඊට පටහැනිව එකම නිලධාරියෙකු විසින් එම සියලු කටයුතු සිදු කර තිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 1646 (ආ) | වාහන සම්බන්ධයෙන් හා ඒවායේ උපකරණ පිළිබඳව වාර්ෂිකව සමීක්ෂණය කළ යුතු වුවද එසේ කර නොතිබුණි. |
| (vi) මුදල් රෙගුලාසි 1647 (ඉ) | වාහන සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
------------------------------

| | |
|---|---|
| (i) 1999 පෙබරවාරි 26 දිනැති අංක 02/99 දරන චක්‍රලේඛය | ජංගම දුරකථන ලබාදීම කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්ට පමණක් සීමා කර තිබුණද, ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් වෙත රු.42,990 ක වියදමක් දරමින් ජංගම දුරකථන 02 ක් සපයා තිබුණි. |
| (ii) 2007 සැප්තැම්බර් 11 දිනැති අංක 21/2007 දරන චක්‍රලේඛය | ආයතනයේ නිලධාරින් දෙදෙනෙකු විදේශගත වීමේදී අග්‍රාමාත්‍යවරයාගෙන් නිවාඩු අනුමත කර ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.3 ඡේදය | ස්ථාවර තැන්පතුවල මුදල් ආයෝජනය සඳහා මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ ලබා නොගෙන රු.මිලියන 4.9 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ඉ) | 2003 අගෝස්තු 25 දිනැති අංක එම්එෆ්/6/1/2/03 දරන මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛය හා 2003 ඔක්තෝබර් 28 දිනැති අංක පීඊඩී/17 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | දේශීය අරමුදල් භාවිතයට යොදා ගනිමින් නිලධාරීන් විදේශගත වීමේදී රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් විදේශ ගමන් තුනක් සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඊ) | ශ්‍රී ලංකා ජාතික ප්‍රසම්පාදන ආයතනයේ උපදේශක සේවා මාර්ගෝපදේශය | ශ්‍රවණාගාර උපදේශකවරයාට ගෙවීම් කිරීමේදී 2007 වර්ෂයේ නිකුත් කළ ශ්‍රී ලංකා ජාතික ප්‍රසම්පාදන ආයතනයේ උපදේශක සේවා මාර්ගෝපදේශයට අනුකූල වන පරිදි ගෙවීම් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.706,772 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් කටයුතුවලින් රු.6,086,352 ක ඌනතාවයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,379,580 ක වාසිදායක වර්ධනයක් නිරීක්ෂණය වූ අතර එම වර්ධනය කෙරෙහි රජයේ ප්‍රදාන රු.5,703,066 කින් හා ආයතනයේ ඉපයූ ආදායම රු. 5,079,920 කින් වැඩිවී තිබීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2001 අංක 1 දරන ජාතික සමුපකාර සංවර්ධන ආයතන (සංස්ථාපනය කිරීමේ) පනතේ 4 වගන්තිය පරිදි ආයතනය සංස්ථාගත කිරීමෙන් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත වූ සමුපකාර සංවර්ධනය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, කළමනාකරණ නිපුණතා අවශ්‍ය

වන සමුපකාර ව්‍යවසාය කළමනාකරණය කිරීම සහ ඒවාට වෘත්තීය උපදෙස් සැපයීම යනාදී ප්‍රධාන කාර්යයන් ඉටු කර නොතිබුණි.

(ආ) ආයතනය විසින් පවත්වන පාඨමාලාවල ප්‍රගතිය
---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ වෘත්තීය ඩිප්ලෝමා පාඨමාලා 14 ක් පැවැත්වීමට ඉලක්කගත කර තිබුණද ඉන් පාඨමාලා 08 ක් පමණක් පවත්වා තිබුණි. ඒ සඳහා අපේක්ෂිත අයදුම්කරුවන් 243 කින් අයදුම්කරුවන් 162 ක් පමණක් පාඨමාලා හදාරා තිබුණු අතර ප්‍රගතිය සියයට 67 ක් විය.

(ii) ඉලක්කගත කර තිබුණු සහතික පත්‍ර පාඨමාලා 11න් 08 ක් පමණක් පවත්වා තිබුණු අතර ඉලක්කගත අයදුම්කරුවන් සංඛ්‍යාව 290කින් 241ක් සහභාගි වී තිබුණු බැවින් ප්‍රගතිය සියයට 83 ක් විය .

(iii) සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත කෙටිකාලීන කළමනාකරණ සංවර්ධන පාඨමාලා 26 කින් පාඨමාලා 22 ක් පවත්වා තිබුණු බැවින් ප්‍රගතිය සියයට 85 ක් විය.

(iv) සමුපකාර සමිති සහ වෙනත් සමුපකාර ආයතනවල ඉල්ලීම මත පවත්වන ලද පාඨමාලා 17 ක් හා සමුපකාර ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා සමුපකාර සංවර්ධන අරමුදලින් හා මහජන බැංකුව ලබාදුන් ආධාර යටතේ නොමිලයේ හා සහනදායී පදනම මත පාඨමාලා 04 ක් පවත්වා තිබුණ අතර එම පාඨමාලා පැවැත්වීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 50 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

(v) 2011 වර්ෂයේදී ආරම්භ කළ බාහිර උපාධි, වරලත් ගණකාධිකරණ, ගණකාධිකරණ ශිල්පීය සහ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී යනාදී වෘත්තීය විභාග සඳහා උපකාරක වැඩසටහන් 11 ක් 2013 වර්ෂයේදී පවත්වා තිබුණද ඒ සඳහා සහභාගී වී තිබුණේ පුහුණුලාභීන් 188 දෙනෙකු පමණි. එය 2012 වර්ෂය හා සැසඳීමේදී සියයට 12 ක අඩුවීමක් විය.

(ඇ) ආයතනය විසින් පැවැත්වූ පාඨමාලාවලින් ලද ආදායම් ප්‍රගතිය
-----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත කෙටිකාලීන කළමනාකරණ පාඨමාලා ආදායම ඉක්මවා ආදායම් උපයා තිබුණද ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.2,177,746 කින් එනම් සියයට 31 කින් ආදායම පිරිහීමට ලක්වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ නිත්‍ය පුහුණු, වෘත්තීය සහතික පත්‍ර පාඨමාලා හා වෘත්තීය ඩිප්ලෝමා පාඨමාලා සඳහා ඉලක්කගත ආදායමට සාපේක්ෂව තථ්‍ය ආදායමේ රු.5,383,116 ක අඩුවීමක් වූ අතර එය ඉලක්කගත ආදායමෙන් සියයට 42 ක අඩුවීමක් විය.

(ඇ) සමුපකාර කිරි ගම්මාන ව්‍යාපෘතිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2013 ඔක්තෝබර් 06 දිනැති අංක එන්පී/3 දරන ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු චක්‍රලේඛය අනුව, සමාලෝචිත වර්ෂයේ ආරම්භ කර තිබුණු සමුපකාර කිරි ගම්මාන ව්‍යාපෘතියට අදාළ ව්‍යාපෘති යෝජනාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙන් අනුමත කර නොතිබුණු අතර ඒ සඳහා ප්‍රතිපාදන 2013 වාර්ෂික අයවැය ලේඛනයෙන් සලසා නොතිබුණි.

(ii) ඇස්තමේන්තුගත රු.20,000,000 ක මුදලින් මහජන බැංකුව, සමුපකාර අරමුදල සහ ජාතික සමුපකාර සංවර්ධන ආයතනවල එකඟතාවයකින් තොරව රු.11,600,000 ක් දායක වන බව සඳහන් කර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය සඳහා වූ රු.3,600,000 ක ඇස්තමේන්තුවෙන් රු.519,712 ක් එනම් සියයට 14.43 ක් පමණක් වැය කර තිබූ බැවින් මෙම වර්ෂය සඳහා අධි ඇස්තමේන්තු සකස් කර තිබුණි.

(iv) ව්‍යාපෘතියේ ප්‍රථම අදියරේදී වයඹ පළාතේ කුරුණෑගල, පුත්තලම සහ කෑගල්ල දිස්ත්‍රික්කවල කිරි ගම්මාන ඇති කිරීමට සැලසුම් කර තිබුණද පුත්තලම දිස්ත්‍රික්කයෙහි එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(v) ව්‍යාපෘති සැලැස්ම අනුව ව්‍යාපෘතිය ආරම්භ කර වසරක් ගත වුවද සැලැස්මේ ඉලක්කයන් සපුරා ගත් ආකාරය පිළිබඳ වූ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණු අතර වැය කර ඇති වියදම් පරීක්ෂා කිරීමේදී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාකාරී සැලැස්ම අනුව, සපුරා ගැනීමට ඉලක්ක කර තිබුණු කාර්යයන් සපුරා නොතිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ ආයතනය සතු අක්කර 26 ක පමණ ඉඩම සඳහා ආයතනය නමින් ලබා ගත යුතු ඉඩමේ අයිතිය තහවුරු කිරීමේ ඔප්පුවක් ලබා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 2 කට වැඩි කාලයක් හිඟහිට තිබුණු රු.752,150 ක් වූ දේශනශාලා, ආහාර, නවාතැන් ගාස්තු හා රු.41,122 ක් වූ මුද්‍රණ ගාස්තු වශයෙන් හිඟහිටි එකතුව රු.793,272 ක ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පිළිවෙත් අප්‍රමාදව ක්‍රියාත්මක කර නොතිබීම සහ වර්ෂ කිහිපයකම විගණන වාර්තාවලින් පෙන්වා දී තිබුණු කරුණු සම්බන්ධයෙන් නිසි සැලකිල්ල දක්වා නොමැතිවීම නිසා තවදුරටත් අයවිය යුතු ආදායම් ශේෂය වාර්ෂිකව වැඩිවී තිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දින වන විට විධිමත් ගිවිසුමකින් තොරව ආයතනයේ කම්කරු නිල නිවාසයක් වර්ෂ 11 කට වැඩි කාලයක් සී/ස මහවැලි සමුපකාර සමිතියට කුළී අයකර ගැනීමකින් තොරව භාවිතා කිරීමට ඉඩ දී තිබුණි. පාතදුම්බර ප්‍රාදේශීය ලේකම්ගේ 2007 අගෝස්තු 08 දිනැති ලිපියේ අනුමත ආර්ථික කුළී තක්සේරුව අනුව, අවුරුදු 06 මාස 05 ක් සඳහා රු.57,750 ක කුළී මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පාඨමාලා ගාස්තු අය කර ගැනීම සඳහා විධිමත් හා ප්‍රමාණවත් පාලන පිළිවෙත් සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබීම, පාඨමාලාවන්ට බඳවා ගැනීමේදී ගාස්තු අය කිරීමේ ප්‍රතිපත්තිමය ක්‍රමවේදයක් ආයතනය තුළ නොතිබීම හා එවැනි ක්‍රමවේදයන් පාඨමාලා මාර්ගෝපදේශය තුළ ඇතුළත් නොකිරීම තුළින් අයදුම්කරුවන් දැනුවත් නොවීම නිසා 2013 දෙසැම්බර් 31 දින වන විට පාඨමාලා ආදායම රු.911,320 ක් හිඟහිට තිබුණි.

(ඉ) භූමිය සඳහා වූ බදු ගිවිසුමේ කොන්දේසි අංක 16 අනුව, භූමියේ අස්වැන්නෙන් හෝ උපයාගනු ලබන මුදලින් කළමනාකරණ මණ්ඩල අනුමැතිය යටතේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක් ආයතනය විසින් නම් කරනු ලබන ගිණුමකට බැර කළ යුතු වුවද, 2010 වර්ෂයේ සිට 2014 ජූලි 25 දක්වා ඒ අනුව කටයුතු කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

(ඊ) සී/ස නුවරඑළිය කෘෂිකාර්මික සමුපකාර සමිතිය කරන ලද ඉල්ලීමක් මත ආයතනයේ ප්‍රධාන පිවිසුම් දොරටුව ආසන්නයේ පැල ගෘහයක් හා අලෙවි සැලක් ගිවිසුමකට එළඹීමකින් තොරව ඉදිකර තිබුණි. එම ඉදිකිරීම සඳහා ප්‍රයෝජනයට ගත් භූමි ප්‍රමාණය කොතෙක්ද යන්න නිශ්චිතව හඳුනා ගෙන නොතිබුණ අතර විධිමත් තක්සේරුවකින් තොරව 2011 අප්‍රේල් මාසයේ සිට රු.5,000 ක මාසික කුළියක් අය කර ගෙන තිබුණි.

(උ) 2012 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මඟින් ඉවත් කළ යුතු බවට හඳුනාගෙන තිබූ ණූ එකතුව රු.5,027,069 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රවණාගාරය සඳහා උපදේශක සේවය

(i) උපදේශක පත්කළ දින සිට ඉදිකිරීම් ස්ථානය අඛණ්ඩව අධීක්ෂණය කළ යුතු අතර වැඩ බිමෙහි ඇති ලොග් පොතේ පැමිණීම සටහන් කළ යුතුය. මෙම පැමිණීමේ ලේඛනය නිවැරදි බවට ආයතනයේ කිසිඳු නිලධාරියකුගේ අධීක්ෂණයට ලක් නොවන අතර සැම මාසයක් සඳහාම ගෙවීම් කර තිබුණි.

(ii) උපදේශක සේවා ලිපිය අනුව, සුදුසුකම්ලත් කාර්මික නිලධාරියෙකු ගොඩනැගිල්ලේ වැඩ කටයුතු අවසානය දක්වා රඳවා තැබීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) සේවා පහසුකම් ප්‍රසම්පාදනය

(i) ආරක්ෂක, පවිත්‍රතා සහ භෝජනාගාර සේවා සැපයීම් කොන්ත්‍රාත්තු සඳහා වාර්ෂිකව ලංසු කැඳවා, ඇගැයීමකින් තොරව, 2011 වර්ෂයේදී අවිධිමත් පරිදි ලබාගත් මිල ගණන් මත කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණු පෞද්ගලික සමාගමටම සමාලෝචිත වර්ෂය සඳහාද ගිවිසුම් කාලය දීර්ඝ කර කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි.

(ii) කොන්ත්‍රාත්තු ගිවිසුම් අනුව පවිත්‍රතා සේවා සැපයීම සඳහා රු.224,930 ක් වූ මාසික ගාස්තුව 2013 ජනවාරි මාසයේ සිට රු.44,620 කින් අවිධිමත් ලෙස වැඩිකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ආයතනයට රු.535,440 ක පාඩුවක් සිදු වී තිබුණි.

(iii) පවිත්‍රතා සේවා සැපයීම් ගිවිසුමේ කොන්දේසි පරිදි, උප කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම කළ නොහැකි වුවද, ඊට පටහැනිව කොන්ත්‍රාත්තුව ලබාගත් පුද්ගලික සමාගම විසින් වෙනත් පුද්ගලික ආයතනයකට උපකොන්ත්‍රාත් ලබාදී තිබුණු අතර මේ සම්බන්ධයෙන් ආයතනය කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iv) ආරක්ෂක සේවාව සැපයීමේ කොන්ත්‍රාත්තු ගිවිසුම අනුව රු.213,000 ක් වූ මාසික ගාස්තුව 2013 ජනවාරි මාසයේ සිට රු.42,000 කින් අවිධිමත් ලෙස වැඩිකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ආයතනයට රු.504,000 ක පාඩුවක් සිදුවී තිබුණි.

(v) ආරක්ෂක සේවාව සැපයීමේ කොන්ත්‍රාත්තු ගිවිසුමේ 2 වන වගන්තිය ප්‍රකාරව, අදාළ සමාගම විසින් රු.50,000 ක ඇපකරයක් ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා 2014 ජූලි 31 දින වන විටත් එම ඇපකරය ලබා ගැනීමට ආයතනය කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2013 ජූනි 25 - 26 දක්වා කාලපරිච්ඡේදය තුළ ඉන්දියාවේ නවදිල්ලි නුවර පවත්වන ලද 16 වන ඉන්දියානු සමුපකාර සමුළුව සඳහා ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු සහභාගි කරවීමට නියමිතව තිබුණු නමුත් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක එම්එෆ්2/57/එන්අයිසීඩී හා 2013 ජූනි 12 දිනැති ලිපිය අනුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වයෙන් ඉවත් කර තිබූ නිලධාරියකු මෙම සමුළුවට සහභාගී වී තිබුණි. රේගු දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරීවරයෙක් වූ මෙම නිලධාරියා ආයතනයේ කාර්ය මණ්ඩලයට බාහිර නිලධාරියෙකු වශයෙන් උක්ත චාරිකාවට සහභාගී කරවීමෙන් එම සංචාරයෙන් ලද අත්දැකීම් හා දැනුම ආයතනයට ලබා ගැනීමට හැකියාවක් නොතිබුණු අතර ඒ සඳහා දරන ලද රු.268,638 ක මුදල නිෂ්කාර්ය වියදමක් විය.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම ලේඛනගත නොවූ ප්‍රමාණය 30 ත් 520 ත් අතර භාණ්ඩ අයිතම වර්ග 07 ක් ගබඩාවේ සහ භාවිතයට ගත නොහැකි කාර්යාලීය ලී බඩු, පරිගණක හා අභ්‍යන්තර දුරකථන පද්ධතියකට අයත් කොටස් ප්‍රධාන ශාලාවේ පිටුපස, පරණ කාර්යාලීය ගොඩනැගිල්ලේ කොරිඩෝව තුළ හා භාවිතයට නොගන්නා දේශකවරුන්ගේ කාමරවල නිශ්ක්‍රීයව තිබුණි.

(ආ) ශ්‍රව්‍ය දෘශ්‍ය අංශයේ 2012 වර්ෂයේදී කළ භාණ්ඩ සමීක්ෂණයෙන් ප්‍රයෝජනයට ගත නොහැකි ලෙස හඳුනා ගත් භාණ්ඩ තොගය සම්බන්ධයෙන්ද කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 71 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 30 ක් වූයෙන්, පුරප්පාඩු සංඛ්‍යාව 41 ක් විය. මෙම පුරප්පාඩු පිරවීම සඳහා මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව අනුමැතිය ලබා දී ඇතත් එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2002 මැයි 24 දිනැති අංක පීඊ/පීඑස්/21 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 22 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

2009 ජුනි 09 දින හා අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 3 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතු වුවද එසේ කර නොතිබුණු හෙයින් අභ්‍යන්තර විගණන කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. කෙසේ නමුත් අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය හරහා සිදු කිරීම කෙරෙහිද අවධානය යොමුවී නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.4 නොවිසඳී ඇති විගණන ඡේද**

පසුගිය විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති නමුත්, ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු විගණන ඡේද පහත දැක්වේ.

| 2012 වර්ෂයේ විගණන ඡේදයට යොමුව | විගණන ඡේදයේ සාරාංශය |
|---|---|
| (අ) 4.1 (අ) | 2001 අංක 1 දරන ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (සංස්ථාපනය කිරීමේ) පනතේ 4 වගන්තිය පරිදි ආයතනය සංස්ථාගත කිරීමෙන් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත වූ ප්‍රධාන කාර්යයන් ඉටු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 4.4 අනාර්ථික ගනුදෙනු | තොරතුරු තාක්ෂණ විෂයයට අදාළ පාඨමාලා ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාවෙන් බැහැරව කොන්ත්‍රාත් පදනම මත උපදේශකවරයකු බඳවාගෙන 2012 වර්ෂයේදී උපදේශක දීමනා වශයෙන් රු.360,000 ක් ගෙවීම් කර තිබුණද අදාල අරමුණ ඉටු වී නොතිබුණි. |
| (ඇ) 4.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු | |
| (අ) ශ්‍රවණාගාරය ඉදිකිරීම | උපදේශක සේවා සැපයූ උපදේශකවරිය රාජ්‍ය සේවයේ නියුක්තව සිටියදී අනවසරයෙන් පෞද්ගලික උපදේශක සේවා සපයා, රු.මිලියන 2.15 ක් වූ ගාස්තු ලබා ගැනීම සම්බන්ධයෙන් ඇයට එරෙහිව විනයානුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 5.2 අභ්‍යන්තර විගණනය | මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි. |

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් කළමනාකරණය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) ඉදිකිරීම් හා සේවා සැපයීම් කොන්ත්‍රාත්තු පරිපාලනය

(ඉ) මානව සම්පත් කළමනාකරණය